# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
பௌத்த மத அலுவல்கள் திணைக்களம்
DEPARTMENT OF BUDDHIST AFFAIRS
"දහම්පාය", අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.
"தஹம்பாய" இல. 135, ஸ்ரீமத் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
"Dahampaya" No. 135, Srimath Anagarika Dharmapala Mawatha, Colombo 07.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, මහනුවර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், கண்டி.
Regional Office, District Secretariat Building, Kandy.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, රත්නපුර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், இரத்தினபுரி.
Regional Office, District Secretariat Building, Ratnapura.


| මගේ අංකය / எனது இல. / My No. | බෞ/කො/දපා/04/ගුරු විභාග 2024 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024.05.30 |
|---|---|---|---|---|---|

සියලුම ප්‍රදේශීය ලේකම්වරුන් වෙත.

**<u>දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය - 2024</u>**

**<u>අයදුම්පත්‍ර කැඳවීම</u>.**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ දී දිවයින පුරා මධ්‍යස්ථාන 22 කදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

02. මේ සඳහා අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද චක්‍රලේඛය හා මාර්ගගත (On-line) අයදුම් පත්‍රයේ QR කේතය මේ සමග එවමි. චක්‍රලේඛයේ උපදෙස් පරිදි සුදුසුකම් සහිත දහම් පාසල් ගුරුභවතුන්ගේ අයදුම්පත් 2024.06.30 දිනට පෙර මාර්ගගත ක්‍රමයට මා වෙත යොමු කරන ලෙස සියලුම දහම් පාසල්, බෞද්ධ කටයුතු නිලධාරීන් මගින් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. ඉහත විභාගය සම්බන්ධයෙන් දහම් පාසල් වෙත වෙනත් දැනුම්දීමක් කර නොමැති බැවින් ඔබ ලේකම් කාර්යාලයට අදාල දහම් පාසල් දැනුවත් කර එසේ දැනුවත් කළ බවට සටහනක් තබා ගන්නා ලෙසද වැඩි දුරටත් දන්වමි.

ආර්.එම්.පී.රත්නායක
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

පිටපත්.

01. ගරු ප්‍රධාන ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ
සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය - ගෞරවනීය දැන ගැනීම සඳහා
02. දිස්ත්‍රික් ලේකම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කරු. අදාල නිලධාරීන් කාර්යය සඳහා යෙදවීම.
03. බෞද්ධ කටයුතු නිලධාරීන් (දිස්ත්‍රික්/ප්‍රාදේශය) - කරු. අදාල කාර්යය ඉටු කිරීමට


| කොමසාරිස් ජනරාල් / ஆணையாளர் நாயகம் / Commissioner-General | ෆැක්ස් / தொலைநகல் / Fax | කාර්යාලය - පොදු / அலுவலகம் - பொது / Office-General | මහනුවර කාර්යාලය / கண்டி அலுவலகம் / Kandy Office | රත්නපුර කාර්යාලය / இரத்தினபுரி அலுவலகம் / Ratnapura Office |
|---|---|---|---|---|
| 011-2337350 | 011-2337355 | 011-2307674, 011-2307694 | 081-2225152 | 045-2222637 |

www.dba.gov.lk බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය dba.gov.lk@gmail.com
புத்தசாசன, மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு Ministry of Buddhasasana, Religious and Cultural Affairs

බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

# දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය - 2024
# අයදුම්පත්‍ර කැඳවීම.

සදාචාර සම්පන්න දරු පරපුරක් සමාජයට දායාද කිරීම සඳහා නිශ්ශරණාධ්‍යාශයෙන් තම සේවය ලබාදෙන දහම් පාසල් ගුරුවරුන් අගය කිරීම, දැනුමෙන් සන්නද්ධ කිරීම හා සමාජ පිළිගැනීමක් ලබාදීමේ අරමුණින් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය සඳහා සුදුසුකම් ලාභී දහම් පාසල් ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **මූලික සුදුසුකම්.**

I. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දහම් පාසලක 2024.06.05 වන විට මාස 06ක අඛණ්ඩ සේවා කාලයක් තිබීම.

II. 2024.01.05 දිනට වයස අවුරුදු 18ට සම්පූර්ණ වී තිබීම.

02. **විභාගය පවත්වන ආකාරය හා දිනය** .

උක්ත විභාගය 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර විභාගය පවත්වන දිනය අයදුම්කරුවන් වෙත තැපැල් මගින් දැනුවත් කරනු ලබන අතර පහත දැක්වෙන විභාග මධ්‍යස්ථානයන්හි දී සිංහල මාධ්‍යයෙන් විභාගය පවත්වනු ලබයි.

03. **යෝජිත විභාග මධ්‍යස්ථාන.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | විභාග මධ්‍යස්ථානය හා අංකය |
|---|---|---|
| 01 | කොළඹ | කොළඹ 01 |
| 02 | ගම්පහ | ගම්පහ 02 |
| 03 | කළුතර | කළුතර 03 |
| 04 | මහනුවර | මහනුවර 04 |
| 05 | මාතලේ | මාතලේ 05 |
| 06 | නුවරඑළිය | නුවරඑළිය 06 |
| 07 | ගාල්ල | ගාල්ල 07 |
| 08 | මාතර | මාතර 08 |
| 09 | හම්බන්තොට | හම්බන්තොට 09 |
| | | තංගල්ල 10 |
| 10 | අම්පාර | අම්පාර 11 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | විභාග මධ්‍යස්ථානය හා අංකය |
|---|---|---|
| 11 | කුරුණෑගල | කුරුණෑගල 12 |
| | | පඬුවස්නුවර 13 |
| 12 | පුත්තලම | පුත්තලම 14 |
| 13 | අනුරාධපුර | අනුරාධපුර 15 |
| 14 | පොලොන්නරුව | පොලොන්නරුව 16 |
| 15 | මොනරාගල | මොනරාගල 17 |
| 16 | බදුල්ල | බදුල්ල 18 |
| | | බණ්ඩාරවෙල 19 |
| 17 | රත්නපුර | රත්නපුර 20 |
| 18 | කෑගල්ල | කෑගල්ල 21 |
| 19 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය 22 |

04. **ප්‍රශ්න පත්‍රයේ සංයුතිය හා විෂය නිර්දේශය.**

I. දහම් පාසල්වල දැනට භාවිතා වන පලමු ශ්‍රේණියේ සිට දහවන ශ්‍රේණිය දක්වා ශ්‍රේණි පෙළ පොත්, ගුරු අත්පොත් හා දහම් පාසල් කලමනාකරණ පොත ප්‍රශ්න පත්‍රය සඳහා පාදක කරගනු ලැබේ.

II. ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 03කි. කොටස් 03කි. පහත සඳහන් පරිදි ප්‍රශ්න පහක් සඳහා පිළිතුරු සැපයිය යුතුය.

| | | |
|---|---|---|
| i. කොටස | මෙම කොටස කෙටි ප්‍රශ්න 10 කින් යුක්ත වන අතර , ඒ සඳහා අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු වේ. | ලකුණු 2X10 = 20 |
| ii. කොටස | මෙම කොටසින් එක් ප්‍රශ්නයක් අනිවාර්යයෙන්ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න තෝරාගත යුතුය.<br>**ඉගැන්වීම් ක්‍රම විද්‍යාව, බුද්ධ චරිතය, චරිත කථා අධ්‍යාපනය, ශාසන ඉතිහාසය, බෞද්ධ සංස්කෘතිය**, යනාදි විෂය කරගත් රචනා ශෛලියේ ප්‍රශ්න කිහිපයකින් යුක්ත වේ. | ii හා iii කොටස් දෙකෙන් එක් කොටසකින් අවමය එක් ප්‍රශ්නයක් ඇතුලත් වන පරිදි ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය .<br><br>ලකුණු 4 X 20 = 80 |
| iii. කොටස | මෙම කොටසින් එක් ප්‍රශ්නයක් අනිවාර්යයෙන්ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න තෝරාගත යුතුය.<br>**අභිධර්මය, පාලි, භාවනා** යනාදිය විෂය කර ගනිමින් රචනා ශෛලියේ ප්‍රශ්න කිහිපයකින් යුක්තවේ. | |

05. **සාමාර්ථ්‍යයන් පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ.**

- 00 ≤ 34 දුර්වලයි.
- 35 ≤ 49 සාමාන්‍ය සාමර්ථ්‍යය.
- 50 ≤ 64 සම්මාන සාමාර්ථ්‍යය.
- 65 ≤ 74 අධිසම්මාන සාමර්ථ්‍යය.
- 75 ≤ 100 විශිෂ්ට සාමර්ථ්‍යය.

06. **විභාගය සඳහා අයදුම් කිරීම.**

අදාල අයදුම්පත මේ වන විට අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර පරිගණකයක්, ටැබ් යන්ත්‍රයක්, හෝ ස්මාර්ට් දුරකතනයක් භාවිතා කරමින් මාර්ගගත (On-line) ක්‍රමයට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

I. පහත සඳහන් ක්‍රමවේද මඟින් අයදුම් පත්‍රය වෙත ප්‍රවේශ විය හැකි ය.
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ (www.dba.gov.lk) වෙබ් අඩවියේ මුල් පිටුවේ (Home page) සඳහන් “දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2024” වෙත පිවිස එහි ඇති සබැඳිය (link) භාවිතා කරමින් හෝ
- Dhamma school app වෙත පිවිස එහි ඇති සබැඳිය (link) භාවිතා කරමින් හෝ
- මෙම දැන්වීමේ ඇති QR කේතය ස්කෑන් කිරීමෙන් හෝ
- අයදුම් පත්‍රයේ සබැඳිය (link) බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරි මගින් ඔබේ ස්මාර්ට් දුරකතනයට What’s app මගින් ලබාගෙන අයදුම්පතට ප්‍රවේශ විය හැකිය.

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.06.30 වේ. ඉන්පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. මාර්ගගත ක්‍රමය (On-line) ඔස්සේ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු එහි පිටපතක් තමා සන්තකයේ තබා ගැනීම වඩා යෝග්‍ය වේ.

IV. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති මාර්ගගත (On-line) ක්‍රමයට පමණක් අයදුම් කළ යුතු අතර එසේ නොවන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම, අසම්පූර්ණ ලෙස මාර්ගගත (On-line) අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම, නියමිත දිනට අයදුම්පත්‍ර ඉදිරිපත් නොකිරීම, හා සාවද්‍ය තොරතුරු සැපයීම අයදුම්කරු වෙත කරුණු නොදන්වා ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

V. අයදුම්කරුවන් 100 ක් හෝ ඊට වැඩි පිරිසක් ඇති සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම එක් විභාග මධ්‍යස්ථානය බැගින් ස්ථාපිත කරනු ලැබේ. ඊට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්වන දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථාන වෙත අනුයුක්ත කරනු ලැබේ.

VI. විභාගය සඳහා අයදුම්කරන සියලුම දහම් පාසල් ගුරුවරුන් අනිවාර්යයෙන්ම විභාගය සඳහා පෙනී සිටිය යුතුය.

07. <u>විභාගයට ඉදිරිපත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.</u>

I. සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍රය අයදුම්පත්‍රයේ සඳහන් ලිපිනයට තැපැල් මගින් එවනු ලැබේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රවේශ පත්‍රය ගරු ප්‍රධානාචාර්ය මගින් සහතික කර විභාග දිනයේ දී ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය.
එමෙන්ම විභාගයේ දී සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාගය පැවැත්වෙන අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු අතර අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවස්තාව නොලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය
- දහම් පාසල් ගුරු හැඳුනුම්පත

II. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල Dhamma school app හි හා අයදුම්කරුගේ ලිපිනයට තැපැල් මගින් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

III. විභාගය පැවැත්වීම, අවලංගු කිරීම හා විභාගය සම්බන්ධ අවසාන තීරණ ගැනීමේ පූර්ණ බලතල බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සතු වේ.

මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීමක් හෝ විමසීමක් වෙතොත් බෞද්ධ කටයුතු කොමසාරිස් (දහම් පාසල්) වෙත ඉදිරිපත් කළ යුතු වේ. ( විමසීම 0112 337 338 )

ආර්.එම්.පී.රත්නායක
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය
2024 අයදුම් පත්‍රය

https://forms.office.com/r/PW1PW20Zs4